චක්‍රලේඛ අංක: 03/2018

මගේ අංක :ඩී4/විවිධ (1 වෙළුම)
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09,
2019.02.05

සියලුම බන්ධනාගාර අධිකාරීන් /සහකාර අධිකාරීන් වෙත.

<u>පුනරුත්ථාපන නිලධාරීන්ගේ ක්ෂෙත්‍ර රාජකාරි ගමන් වියදම් දීමනා</u>

උක්ත කරුණ මැයෙන් මවිසින් නිකුත් කරන ලද 31/2008 දරණ 2008.07.05 දිනැති චක්‍රලේඛය හා 40/2008 දරණ 2008.10.06 දිනැති චක්‍රලේඛය මින් අවලංගු කරමි.

02. බන්ධනාගාර ගත වන සිරකරුවන් අතරින් බලපත්‍ර මත මුදා හැරීමට සුදුසුකම් ලබන සියලුම සිරකරුවන් නිවාස නිවාඩු යැවීම,බලපත්‍රමත මුදා හැරීම හා ඒ ආශ්‍රිත වාර්තා සැකසීම මෙන්ම අධීක්ෂණ කටයුතු අනිවාර්යයෙන්ම සිදු කල යුතු බැවින් පුනරුත්ථාපන නිලධාරීන්ගේ ක්ෂෙත්‍ර රාජකාරි කටයුතුවල වැඩි වශයෙන් යෙදීමට සිදුව ඇත.

03. එමෙන්ම රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ මගින් විටින් විට නිකුත් කරනු ලබන චක්‍ර ලේඛ මගින් සංයුක්ත දීමනා සංශෝධනය කිරීම් වලට සමගාමීව දැනට නිකුත් කර තිබෙන චක්‍රලේඛය ද විටින් විට සංශෝධනයට ලක් කිරීමට සිදු වීම සැලකිල්ලට ගෙන මින් ඉදිරියට සියලුම ශ්‍රේණිවලට අයත් පුනරුත්ථාපන නිලධාරීන් සඳහා මසකට උපරිම දින 10 ක සංයුක්ත දීමනාවකට යටත්ව ක්ෂෙත්‍ර සේවයේ යෙදීමට මින් අනුමැතිය දෙමි.

04. ඉහත චක්‍ර ලේඛයෙන් සහ මීට අදාළ සෙසු චක්‍ර ලේඛ ලිපි වලින්ද දී ඇති උපදෙස් වලට අනුව බන්ධනාගාර කොමසාරිස් (පුනරුත්ථාපන) ගේ අනුමැතිය පරිදි මෙම නිලධාරීන් යෙදෙන ක්ෂෙත්‍ර රාජකාරි කටයුතු වලට අදාළ වාර්තා ක්ෂෙත්‍ර රාජකාරි නිම වූ වහාම සැපයිය යුතු බව අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලෙස දන්වමි.

05. මෙම වාර්තා නියමිත පරිදි සැපයූ බව තහවුරු වීමෙන් අනතුරුව ඊළඟ මාසයේ ක්ෂෙත්‍ර රාජකාරි වැඩසටහන ඔබ විසින් නිර්දේශ කර බන්ධනාගාර කොමසාරිස් (පුනරුත්ථාපන) වෙත යොමු කිරීමට ඔබ විසින් වග බලා ගත යුතුය.

එච්.එම්.එන්.සී.ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්